**රිදිමාලියද්ද ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

-------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2017 වර්ෂයේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 16 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 30 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට රිදිමාලියද්ද ප්‍රාදේශීය සභාවේ සංශෝධිත මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමට බැර විය යුතු කර්මාන්ත රැඳවුම් මුදල් රු.55,000 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් බැරකම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු රු.29,000 ක් ඉදිරි ගෙවුම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම වටිනාකම වර්ෂයේ ආදායම අඩුවෙන් සහ ජංගම වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳූ ගිණුම්**

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.2,314,120 ක් වුවද,පොදු තැන්පත් ලේඛනය අනුව ශේෂය රු.2,977,828 ක් වුයෙන් රු.663,708 ක වෙනසක් විය.

(ආ) ඉකුත් වර්ෂයේ තොග ශේෂ 04 ක් සමාලෝචිත වර්ෂයට ඉදිරියට ගෙන ඒමේදී රු.203,212 ක වෙනසක් විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

----------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු.22,427,066 ක් වු ගිණුම් ශේෂය තුළ වර්ෂ 03 ක් කල්පසු වු හිඟහිටි ප්‍රාග්ධන ආධාර රු.22,251,036 ක්,වර්ෂයක් කල්පසු වු

ව්‍යාපාර බදු රු.3,450 ක් වර්ෂ 03 ක් කල්පසු වූ කඩකුලී රු.172,580 ක් සමාලෝචිත වර්ෂයේදී අයකර නොතිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.26,573,008 ක් වූ ගෙවිය යුතු ශේෂය තුළ වර්ෂ හතරක් කල්පසු වූ වියදම් ණය හිමියෝ රු.251,475 ක් ,වර්ෂ 03 ක් කල්පසු වූ කර්මාන්ත ණයහිමියෝ රු.22,564,668 ක් හා වර්ෂ 02 ක් කල්පසු වූ ණයහිමියෝ රු.3,756,865 ක් වූ ශේෂයන් නිරවුල් කර නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

-------------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 71,492,372 ක් වූ ගිණුම් විෂයයන් 03ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 **අනුකූල නොවීම්**

-------------------

1.3.5.1 **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | ---------------------------- | ------------- | --------------------- |
| | | | රු. | |
| (අ) | | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | |
| | (i) | 132(ඔ) වගන්තිය | 95,925 | අමාත්‍යවරයාගේ පූර්ව අවසරය නොමැතිව සභාවට අයත් බැකෝ ලෝඩරය සුභසාධන සමිතියකට කුලී හා ඉන්ධන රහිතව පැය 41.7 ක සේවය සඳහා ලබාදී තිබුණි. |
| | (ii) | 158,159 වගන්ති | 757,410 | සභාවේ ලේකම්වරයා විසින් ඉකුත් වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ ආදායම් අය කරගෙන නොතිබුණි. |
| (ආ) | | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | |
| | (i) | රීති 214 | | වාර්ෂිකව ගබඩා ද්‍රව්‍ය සමීක්ෂණයක් කර නොතිබුණි. |
| | (ii) | රීති 218 | | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කර ලේඛනගත කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| (i) | xxiv පරිච්ඡේදයේ 1.6 වගන්තිය | 25,173 | සභාවේ සේවය කර ස්ථාන මාරුවීම් ගිය සේවකයින් 5 දෙනෙකුගෙන් 1996 වර්ෂයේ සිට අය විය යුතුව පැවත එන සේවක ණය අය කරගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) | මුදල් රෙගුලාසි 104(3) | | බැකෝ යන්ත්‍රයට සිදුවී තිබුණු අනතුර සම්බන්ධව 2017 දෙසැම්බර් 31 දින වනවිටත් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 110 | | හානි පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 133 | | සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 571 | 24,468 | වර්ෂ 02ක් කල් ඉකුත් වූ තැන්පත් ශේෂ 4 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - 2016 දෙසැම්බර් 30 දිනැති අංක 2000(iv)(ආ) කොටස. | | සංවර්ධනය නොකළ එක් එක් භූමියෙන් සියයට එකක වාර්ෂික බද්දක් පනවා තිබුණද,එවැනි ඉඩම් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,096,770 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,020,808 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 332,676 | 336,768 | 336,768 | -- | 177,240 | 254,238 | 254,238 | -- |
| (ii) කුලී | 5,425,951 | 5,596,690 | 5,596,690 | -- | 5,219,600 | 5,219,600 | 4,108,636 | 1,110,964 |
| (iii)බලපත්‍ර ගාස්තු | 719,000 | 751,125 | 751,125 | -- | 624,000 | 758,150 | 758,150 | -- |
| (iv)වෙනත් ආදායම | 1,045,600 | 1,045,600 | 591,092 | 454,508 | 650,100 | 704,298 | 704,298 | -- |
| එකතුව | 7,523,227 | 7,730,183 | 7,275,675 | 454,508 | 6,670,940 | 6,936,286 | 5,825,322 | 1,110,964 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කල ආදායම රුපියල් මිලියන 7.7 ක් වූ අතර, වර්ෂය තුල රැස්කල ආදායම රුපියල් මිලියන 7.2 ක් විය. කෙසේ වුවත් වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 0.45 ක ආදායමක් අයකර ගැනීමට තිබුණු අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් සියයට 59 කින් අඩුවී තිබුණි.

### 2.2.3 උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.300,000 ක් සහ මුද්දර ගාස්තු රු.1,200,000 ක් අයවිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරි සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

(ආ) **පාරිසරික ගැටළු**

සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබුණු අතර,එක්රැස් කරනු ලබන කසල ආදාඋල්පත සුසාන භූමියට අක්‍රමවත් ලෙස බැහැර කර තිබුණි.

(ඇ) **තිරසර සංවර්ධන ඉලක්ක**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2017 දෙසැම්බර් 31 දින තෙක් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

(අ) **ත්‍රිරෝද රථගාල් සඳහා කුලී අයකර නොගැනීම**

----------------------------------------------------

සභා බල ප්‍රදේශය තුල 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පවතින ත්‍රිරෝද රථ ගාල් 13 ක ත්‍රිරෝද රථ 154 ක් වාර්ෂිකව රු. 1,000 බැගින් ගාස්තුවක් ලබා ගෙන ලියාපදිංචි කර තිබුණි. එසේ වුවත් ලියාපදිංචි ත්‍රිරෝද වලින් සභාවට ආදායම් උපයා ගැනීමට අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා නීතිගත කර නොතිබුණි.

(ආ) **ආඳාඋල්පත සතිපොල ටෙන්ඩර් කිරීම**

-----------------------------------------

සභාවට අයත් ආඳා උල්පත සතිපොල රු.131,500 කට බදුදීමට 2014 ජනවාරි 21 දින බදු ගිවිසුම් අත්සන් කර තිබුණු අතර,2015 අප්‍රේල් 20 දින බදුකරු ගිවිසුමෙන් ඉවත්වී තිබුණි. 2015 ජූලි 07 දිනැති සභා තීරණය පරිදි පොල බදු සභාව මඟින් එකතුකර තිබීමෙන් සභා අරමුදලට රු.333,467 ක පාඩුවක් සිදුවී තිබුණි. සභා තීරණයට දායක වූ සියළු පාර්ශවයන්ගෙන් සිදුවී තිබුණ පාඩුව අය කර ගැනීමට පළාත් පාලන කොමසාරිස්වරයා විසින් 2016 අගෝස්තු 18 දින දන්වා තිබුණද, 2017 දෙසැම්බර් වනවිටත් කිසිදු මුදලක් අය කරගෙන නොතිබුණි.

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

(අ) **කඩ කාමර නව තක්සේරු කුලිය අනුව ගිවිසුම්ගත නොවීම**

-----------------------------------------------------------------

(i) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අවුරුදු පහකට වරක් බදු කුළිය තක්සේරුකර නව ගිවිසුම අනුව බදු කුලිය අයකර ගත යුතු වුවත්, සභාවේ කඩ කාමර 2 ක් සඳහා ගිවිසුම් වලට එළඹීමෙන් තොරව තාවකාලික තක්සේරු වාර්තා පදනම් කරගෙන රු. 136,650 ක වාර්ෂික කුලියක් අයකර ගෙන තිබුණි.

(ii) ඉහත (i) ඡේදයේ සඳහන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් කුලිය තක්සේරු කරගත යුතු වුවත්, සභාවට අයත් කඩ කාමර 09 ක් සඳහා සභාව විසින් කුලිය තක්සේරු කර බදු දී තිබුණි.

(ආ) **නොපියවූ අත්තිකාරම්**

-------------------------

2014 වර්ෂයේදී සභාව විසින් ගොවි සංවිධාන 09 ක් වෙත අවස්ථා 15 කදී ඉදිකිරීම් සඳහා රු. 596,835 ක අත්තිකාරම් ලබාදී තිබුණි. අදාල ඉදි කිරීම් සම්පූර්ණ කර නොතිබුණු අතර, 2017 දෙසැම්බර් 31 දින වනවිටත් අත්තිකාරම් මුදල් අයකර ගෙන නොතිබුණි.

3.4 **ප්‍රසම්පාදනය**

---------------

3.4.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 4:2 මාර්ගෝපදේශ සංග්‍රහය අනුව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

-----------------------------------------

4.1 **අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයෙහි ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී ආදායම් විෂයයන් 07ක සියයට 26 සිට සියයට 100 දක්වා වූ පරාසයක සහ

වියදම් විෂයයන් 08 ක සියයට 15 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. **පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර,පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | --------------- | | -------------- |
| (අ) | ගිණුම්කරණය | (i) | ගිණුම්වල ශේෂයන් උපලේඛන සමඟ නොසැසඳීම. |
| | | (ii) | ලෙජරය හා මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යා අතර වෙනස්කම් පැවතීම. |
| | | (iii) | ආදායම් ලේඛන නඩත්තු නොකිරීම. |
| (ආ) | කොන්ත්‍රාත් පාලනය | (i) | වැඩ ආරම්භ නොකරන ලද ව්‍යාපෘති සඳහා ලබාදුන් අත්තිකාරම් අයකර නොගැනීම. |